ඇමුණුම 2

# සවිබල ගැන්වීමේ වැඩසටහන සඳහා තෝරා ගැනීමේ ක්‍රියාවලිය

**සුදුසුකම්ලත් සහභාගිවන්නන් සඳහාඅවශ්‍ය තොරතුරු**

## හැඳින්වීම

- කාන්තා, ළමා කටයුතු සහ සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය යටතේ ඇති සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව, ඇස්වැසුම ප්‍රතිලාභීන් අතර දිළිඳු සහ අන්ත දිළිඳු කාණ්ඩවලට අයත් තෝරාගත් ප්‍රතිලාභීන් සඳහා සවිබල ගැන්වීමේ වැඩසටහනක් ආරම්භ කර ඇත.
- මෙම ලේඛනය මගින් සවිබල ගැන්වීමේ වැඩසටහන සඳහා ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ ක්‍රියාවලිය පිළිබඳ කෙටි පැහැදිලි කිරීමක් සපයයි.
- සවිබල ගැන්වීමේ වැඩසටහන යනු අවදානමට ලක්විය හැකි නිවාස ඒකකවල ආදායම සහ යහපැවැත්ම වැඩිදියුණු කිරීම අරමුණු කරගත් ප්‍රජා මූලික ක්‍රියාවලියකි.
- වැඩසටහන මගින් සහභාගීවන්නන් මනෝ සමාජීය සහ ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම පිණිස ඔවුන් වෙත පුහුණුව, උපදේශනය සහ මූල්‍ය ආධාර ලබා දීමට කටයුතු කෙරේ.
- මෙම වැඩසටහන මගින් නිවාස ඒකක දිළිඳුකමින් මුදවාගෙන තිරසාර ජීවනෝපායකට හුරු කිරීම සඳහා පරිපූර්ණ, කාලානුරූපී සහ ක්‍රමානුකූල මැදිහත්වීම් සහිත වැඩපිළිවෙලක් අනුගමනය කරනුලබයි.
- මෙම සවිබල ගැන්වීමේ වැඩසටහනේ ආරම්භක නියමු කණ්ඩායම ලෙස එක් ග්‍රාම නිළධාරී වසමකින් සහභාගිවන්නන් උපරිම 32 ක පිරිසක් තෝරා ගනු ලැබේ.
- ඔබට මෙම දැනුම්දී ලැබී ඇත්නම්, සවිබල ගැන්වීමේ වැඩසටහනේ පළමු අදියරට සහභාගී වීමපිණිස තෝරා ගන්නා නිවාස ඒකක 32ට අයත්වන සුදුසුකම් ලත් නිවාස 50ක් අතරට ඔබ දැනටමත් ඇතුළත්ව ඇත.
- මෙසේ කෙටි ලැයිස්තු ගත කර ඇති නිවාස ඒකක 50 උදෙසා පවත්වන ලද මූලික සමීක්ෂණයට සහභාගී වීම පිළිබඳ ඔබට ස්තුතියි.

## තෝරාගැනීමසිදුවන්නේකෙසේද?

- සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ඔබ දැනටමත් සහභාගී වී ඇති තෝරාගත් ග්‍රාම නිළධාරී වසම්වලට අදාලව සුදුසුකම් ලත් නිවාස ඒකක50ක් දක්වා සමීක්ෂණය කරයි.
- එම පවුල් 50 අතරින් අහඹු තෝරා ගැනීමේ ක්‍රමවේදය භාවිතා කර නියමු ව්‍යාපෘතිය සඳහා පවුල් 32 ක් තෝරා ගනු ඇත.
- එය දිස්ත්‍රික් ලේකම් විසින් පත් කරනු ලබනතේරීම් කමිටුවක අධීක්ෂණ යටතේ සිදුකරනු ලබන අතර ඒ සඳහා පහත නිලධාරීන් ඇතුළත් වේ:
- දිස්ත්‍රික් ලේකම්වරයා හෝ දිස්ත්‍රික් ලේකම්වරයා විසින් පත් කරනලද ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක්
- දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරයා
- දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂක හෝ සහකාර අධ්‍යක්ෂ
- ව්‍යාපෘතිය ක්‍රියාත්මක ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ ප්‍රාදේශිය ලේකම් වරයා හා ඔහු විසින් නම් කරන ලද ජ්‍යෙෂ්ඨ නිළධාරියෙක්
- ව්‍යාපෘතිය ක්‍රියාත්මක ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ සම්බන්ධිකරණ සමෘද්ධි කළමනාකරු
- මෙම ප්‍රතිලාභීන් එක්සෙල් මෘදුකාංගය (Excel Software ) භාවිතයෙන් තෝරා ගැනීම සඳහා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව තොරතුරු තාක්ෂණ නිලධාරිවරයා.
- මෙම ක්‍රියාවලියට සහායවීම සඳහා ආසියානු සංවර්ධන බැංකුවෙහි තාක්ෂණිකඋපදේශකවරයා

තෝරා ගැනීමේ ක්‍රියාවලිය

- සුදුසුකම් ලත් ලැයිස්තුවෙන් සහභාගිවන්නන් තෝරා ගැනීම සඳහා පරිගණකගත අහඹු තේරීම් ක්‍රමයක් භාවිත කෙරේ.
- තෝරාගත් සහභාගිවන්නන්ගේ ලැයිස්තුව තේරීම් අධීක්ෂණ කමිටුව විසින් සහතික කර අදාළ ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් අනුමත කරනු ලැබේ.
- එසේ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් අනුමත කරනු ලබන ලැයිස්තුව අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ප්‍රසිද්ධියට පත් කෙරේ.
- මෙම අදියරේ දී තේරී පත් නොවූ සුදුසුකම් ලත් නිවාස ඒකක සඳහාසවිබල ගැන්වීමේ වැඩසටහනේ මීළඟ අදියරේදී ප්‍රමුඛත්වය හිමි වේ.
- තෝරා ගැනීමේ ක්‍රියාවලිය අවසන් වූ පසු තෝරාගත් සහභාගිවන්නන්ට ඒ බව දැනුම් දෙන අතර වැඩසටහන හඳුන්වා දීමේ රැස්වීමට ආරාධනා කරනු ලැබේ.
- වැඩසටහන හඳුන්වා දීමේ රැස්වීම අවසානයේ, තෝරාගත් සහභාගිවන්නන් වැඩසටහන් කොන්දේසි සමඟ එකඟ වන්නේ නම්, සහභාගිවන්නා, හා ප්‍රාදේශීය ලේකම්වරයා විසින් බලය පවරන ලද නිළධාරියෙකු අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කරනු ලැබේ.
- පසුව, සහභාගිවන්නන් සහ ඔවුන්ගේ පවුල් ඉතිරිකිරීමේ කණ්ඩායම්වලට සම්බන්ධ කෙරෙන අතර, මාස 24ක කාලයක් සඳහා පුහුණුව, පහසුකම්, ජීවනෝපාය සහය සහ උපදේශනය ලබාගනු ඇත.

විමසීම්

- ඔබට මේ පිළිබඳව කිසියම් ප්‍රශ්නයක් හෝ ගැටලුවක් ඇත්නම් කරුණාකර ඔබ අයත් වසමභාර සමෘද්ධි සංවර්ධන නිළධාරි වරයා හෝ ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් සම්බන්ධිකරණය කරනු ලබන සමෘද්ධි කළමනාකරු හමුවන්න.